*සැ. යු.*– 2006.09.08 දින පළවූ අංක 1,462 දරන ගැසට් පත්‍රයේ II කොටස සහ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,463- 2006 සැප්තැම්බර් 15 වැනි සිකුරාදා - 2006.09.15**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 813 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 808 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 813 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 815 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් .. ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*– (i) ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ජාතික රක්ෂණ භාර අරමුදල පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 සැප්තැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 267

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2273.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 මාර්තු මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50545 මේජර් ජෙනරල් සෝමතිලක ජයවීර, යූඑස්පී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 14 වැනි දින.
කොළඹ දී ය.

09-597

---

2006 අංක 268

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2305.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැන්වීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 අප්‍රේල් මස 10 වන දින සිට මේජර් ජෙනරල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50766 බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජනරල්) විජිරසිරි නිස්සන්ක විජයගුණවර්ධන, ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 අප්‍රේල් මස 11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50766 මේජර් ජෙනරල් විජිරසිරි නිස්සන්ක විජයගුණවර්ධන, ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 අප්‍රේල් මස 11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50766 මේජර් ජෙනරල් විජිරසිරි නිස්සන්ක විජයගුණවර්ධන, ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

09-603

---

2006 අංක 269

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2276.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 මාර්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/50803 බ්‍රිගේඩියර් අහමඩ් රිස්වි සැකී, යූඑස්පී, අයිඑස්සී.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 14 වැනි දින.
කොළඹ දී ය.

09-634

2006 අංක 270

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2302.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජනවාරි මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60385 මේජර් මුණසිංහ උදිත සිල්වා, ආර්ඩබ්පී ආර්එස්පී ගරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින.
කොළඹ දී ය.

09-600

---

2006 අංක 271

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2279.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරි 2001 දෙසැම්බර් මස 23 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61118 කපිතන් (තාවකාලික මේජර්) හැන්ද පූරකගේ මයොන් ප්‍රේමලාල් නාරංගොඩ, ගැහේබ.

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2005 නොවැම්බර් මස 11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61118 මේජර් හැන්ද පූරකගේ මයොන් ප්‍රේමලාල් නාරංගොඩ, ගැහේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

09-607

---

2006 අංක 272

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2292.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරි 2006 මාර්තු මස 01 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60468 කපිතන් (තාවකාලික මේජර්) සුසන්ත ධම්මික අත්තනායක, අයිජී ශ්‍රීලකාහ.

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 02 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60468 මේජර් සුසන්ත ධම්මික අත්තනායක, අයිජී ශ්‍රීලකාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 දින,
කොළඹ දී ය.

09-610

2006 අංක 273

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2299.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරිණිය 2006 මාර්තු මස 24 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61798 කපිතන් (තාවකාලික මේජර්) පුෂ්පා සුදර්ශණී කුමාරි බස්නායක, ශ්‍රීලයුකාබ

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරිණිය 2006 මාර්තු මස 25 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61798 මේජර් පුෂ්පා සුදර්ශණී කුමාරි බස්නායක, ශ්‍රීලයුකාබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 දින,
කොළඹ දී ය.

09-609

---

2006 අංක 274

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2295.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරි 2006 මාර්තු මස 30 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60481 කපිතන් (තාවකාලික මේජර්) බටදූව ආරච්චිගේ අසිත ප්‍රභාත්, සබුබ

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60481 මේජර් බටදූව ආරච්චිගේ අසිත ප්‍රභාත්, සබුබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 දින,
කොළඹ දී ය.

09-608

---

2006 අංක 275

ඩීආර්එෆ්/21/ආර්ර්සීටී/2296.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 පෙබරවාරි මස 20 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/62391 කපිතන් (උපකරණ පාලක) කරුණාරත්න ඔලගම, ශ්‍රීලයුසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 20 වැනි දිනල
කොළඹ දී ය.

09-598

2006 අංක 276

ඩීආර්එෆ්/21/ආර්ඊසීටී/2300.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව -ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61323 කපිතන් (උපකරණ පාලක) සුදසිංහගේ දොන් ජිනදාස, ශ්‍රීලයුසේබ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61323 කපිතන් (උපකරණ පාලක) සුදසිංහගේ දොන් ජිනදාස, ශ්‍රීලයුසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දීය.

09-602

---

2006 අංක 277

ඩීආර්එෆ්/21/ආර්ඊසීටී/2269.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 17 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/62628 කපිතන් (උපකරණ පාලක) සිරිල් රාජපක්ෂ, ශ්‍රීලංසිරෙ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 10 වැනි දින.
කොළඹ දී ය.

09-604

---

2006 අංක 278

ඩීආර්එෆ්/21/ආර්ඊසීටී/2304.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/64149 ලුතිනන් උක්කුරාලලාගේ ආනන්ද ගාමිණී පියදාස, ශ්‍රීලකාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින.
කොළඹ දී ය.

09-599

---

ඩීආර්එෆ්/21/ආර්ඊසීටී/2293.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2005 දෙසැම්බර් මස 31 වන දින සිට අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/64084 2/ලුතිනන් දොන් අසේල ලක්මාල් වලිසිංහ, ගැහේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

09-596

---

2006 අංක 279

ඩීවීඑෆ්/ආර්ඊසීටී/30(x)ඒවයි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 පෙබරවාරි මස 08 දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

නි/1923 කර්නල් ජයකොඩිආරච්චිගේ දොන් රොමෙල් ජයකොඩි

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 01 වැනි දින.
කොළඹ දී ය.

09-605

---

2006 අංක 280

ඩීවීඑෆ්/ආර්ඊසීටී/233 (ii)

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

#### නිල ස්ථිර කිරීම

පහත නම සඳහන් නිලධාරී 2006 ජූලි මස 31 දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/2280 කපිතන් (තාවකාලික මේජර්) අත්තනායක ආරච්චිලාගේ තිලක් කුමාර, ශ්‍රීලංජාආබමු.

#### විශ්‍රාම ගැන්වීම

පහත නම සඳහන් නිලධාරී 2006 අගෝස්තු මස 01 දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/2280 මේජර් අත්තනායක ආරච්චිලාගේ තිලක් කුමාර, ශ්‍රීලංජාආබමු

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.

09-545

---

2006 අංක 281

ඩීවීඑෆ්/ආර්ඊසීටී/9ඒවයි(1).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 මාර්තු මස 01 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්චා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

නි/4450 කපිතන් තිලකරත්න කුරුකුලආරච්චි, ශ්‍රීලයුපොදුසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-606

2006 අංක 282

ඩීවීඑෆ්/ආර්ඊසී/22 (vii) ඒවයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බල සේනාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2005 ඔක්තෝබර් මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

නි/4681 ලුතිනන් (උපකරණ පාලක) මාපා මුදියන්සේලාගේ වීරසේකර, ශ්‍රීලංසිරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 09 වැනි දින.
කොළඹ දී ය.

09-601

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 283

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, බී. ජී. පී. එස්. ද එස්. සේනාරත්න මහත්මිය 2006 පෙබරවාරි මස 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

09-635/1

2006 අංක 284

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ආර්. ආර්. එම්. අමරතුංග මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

09-635/2

2006 අංක 285

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, දයා පීරිස් මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්.

09-648

# ආණ්ඩුවේ නිවේදන

**වෙරළ සංරක්ෂණ පනතේ 16 වැනි වගන්තියේ 2 (ආ) වන උප වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.**

යෝජිත මාගම –කිරින්ද වෙරළ තීරයෙන් ගානට් සහ ඉල්මනයිට් ඛනිජ වැලි කැණීම් හා පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතිය

පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16 (1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව අංක 873, කැළණිය ETA ලංකා ස්වභාවික සම්පත් (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද "මාගම – කිරින්ද වෙරළ තීරයෙන් ඛණිජ වැලි කැණීමේ හා පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතිය" සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ. ව. 9.00 සිට ප. ව. 4.45 දක්වා 2006.09.01 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. ( සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හි පරීක්ෂා කළ නොහැක.)

| | | |
|---|---|---|
| 1. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | – | නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. |
| 2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | – | නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10. |
| 3. මධ්‍යම පරිසර අධිකාරිය | – | හම්බන්තොට |
| 4. නාගරික සංවර්ධන අධිකාරය | – | හම්බන්තොට |
| 5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | – | හම්බන්තොට |
| 6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | – | තිස්සමහාරාමය |
| 7. ප්‍රාදේශීය සභාව | – | තිස්සමහාරාමය |

මෙම යෝජිත මාගම – කිරින්ද වෙරළ තීරයෙන් ගානට් සහ ඉල්මනයිට් ඛණිජ වැලි කැණීම් හා පිරිසැකසුම් කිරීමේ ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2006.09.01 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

ආචාර්ය ආර්. ඒ. ඩී. බී. සමරනායක,
වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10
දුරකථන අංක 011 : 2449754, 011-2387922, 011-2472623
ෆැක්ස් අංක : 0112-438005, 0112-472623.

09-571

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඳන්හේන බටහිර ග්‍රාම නිලධාරී වසමේ නාමය නාමල්තැන්න යනුවෙන් සංශෝධනය කිරීම

මගේ යොමුව : එච්ඒ/ජීඑන්/3/3/පොදු.

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයට අයත් තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 401 කඳන්හේන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම 2006.09.08 දින සිට අංක 401 නාමල්තැන්න යනුවෙන් සංශෝධනය කරනු ලබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. නාම සංශෝධනය කරනු ලබන ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත් වන ගම්වල නම් උපලේඛන අංක 01 හි සඳහන් වේ.

03. ඒ අනුව නාමල්තැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, පොලිස් බල ප්‍රදේශ, උප්පැන්න විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ, පළාත් පාලන ආයතන, ඡන්ද ප්‍රදේශය හා වසමේ කොට්ඨාශ මායිම් උපලේඛන අංක 02 හි සඳහන් වේ.

බී. ජී. කරුණාරත්න,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 28 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 10.

#### උපලේඛන 01

*ග්‍රාම නිලධාරී වසම් නාම සංශෝධනය කිරීම*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *දැනට පවතින වසමේ නම හා ඊට අයත් ගම් හා වතු* | *නාම සංශෝධනයෙන් පසු වසම හා ඊට අයත් ගම් හා වතු* |
|---|---|---|---|
| මහනුවර | තුම්පනේ | කඳන්හේන බටහිර<br>ගම - කඳන්හේන | නාමල්තැන්න<br>නාමල්තැන්න |

#### උපලේඛන 11

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *දැනට පවතින වසමේ නම හා අංකය* | *මහෙස්ත්‍රාත් උසාවිය/ පොලීසිය* | *උප්පැන්න, විවාහ, මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය* | *පළාත් පාලන ආයතනය* | *ඡන්ද ප්‍රදේශය* | *වසමේ මායිම්* |
|---|---|---|---|---|---|---|---|
| මහනුවර | තුම්පනේ | කඳන්හේන බටහිර 401 | ගලගෙදර | මැදසිය පත්තුව | තුම්පනේ | ගලගෙදර | 1. උතුර පූජාපිටිය ප්‍රා. ලේ. කොට්ඨාශය<br>2. දකුණ අලවත්තේගම ග්‍රා. නි. කොට්ඨාශය 399<br>3. නැගෙනහිර හාරිස්පත්තුව ප්‍රා. ලේ. කොට්ඨාශය සහ අලවත්තේගම කොටසක්<br>4. බටහිර - 400 කඳන්හේන නැගෙනහිර |

09-575

---

## වෘත්තීය හා කාර්මික පුහුණු කිරීම් අමාත්‍යාංශය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

### ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක

### ආයතන නිල නාමය වෙනස් කිරීම පිළිබඳව දැනුම් දීමයි

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට අයත් කටුනායක පිහිටි තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනයේ නිල නාමය 2005 වසරේ ඔක්තෝබර් මස 10 වැනි දින පැවති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත වූ පරිදි ඉංජිනේරු තාක්ෂණ ආයතනය යනුවෙන් වෙනස් කල බවත්, ඉදිරියේදී සිදු කරන සියලුම රාජකාරිමය කටයුතු වලදී එම නව නිල නාමය වන ඉංජිනේරු තාක්ෂණ ආයතනය ලෙස භාවිතා කරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයට අයත් දෙපාර්තමේන්තු, මණ්ඩල සහ සියලුම රජයේ ආයතන වලටත් පෞද්ගලික අංශයේ සියලු ආයතන වලටත් ශ්‍රී ලංකා මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
රාජගිරිය.

09-528

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව - අම්බලන්ගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-02403641-101.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 අප්‍රේල් මස 07 වන දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ගාමිණී ඩේවිඩ් විසින් සහතික කරන ලද 2001 අගෝස්තු මස 28 දිනැති අංක 1976 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අළුත්ගම පදිංචි යාගම වාරක රංගජිත් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිතුන්ලක්ෂ හතලිස්හත්දහස් තුන්සිය තිස් දෙකයි ශත පනහක (රු. 23,47,332.50) මුදලක් 2005 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 23,47,332.50 ක මුදලද, 2005 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1976 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිටි කෝරලේ කොස්ගොඩ ගොඩගම පිහිටි නන්දේලියනරාලලාගේ වත්ත හෙවත් පාලවත්ත නමැති බිම සහ ගස්, ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමට මායිම්, උතුරට : වෙලන්ගොඩට යන ගම්සභා පාර ද, නැගෙනහිරට : තෙන්කුට්ටි අදිරියන් හෙවත් අගෝරිස් පදිංචිවවුන්වත් අභික්කගේවත්ත සහ පාලුවත්ත, දකුණට : පාලුවත්ත සහ බස්නාහිරට : එල්. එම්. විජේසිරිවර්ධන මුහන්දිරම් ට අයිති ගොඩැල්ලවත්ත යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) විශාල ඉඩම. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 381/44 යටතේ ලියා පදිංචි කර ඇත.

පෙරකී ඉඩම මිනුම් සැලැස්මක පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිට කෝරලේ කොස්ගොඩ ගොඩගම පිහිටි නන්දේලියනරාලලාගේ වත්ත හෙවත් පාලවත්ත ඉඩමේ ඒ ලකුණු කල බිම සහ ගස්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමට මායිම්, උතුරට : වෙලන්ගොඩට යන ගම්සභා පාර ද, නැගෙනහිරට : තෙන්කුට්ටි අදිරියන් හෙවත් අගෝරිස් පදිංචිවවුන්වත්ත අභික්කගේවත්ත සහ පාලුවත්ත, දකුණට : පාලුවත්ත සහ බස්නාහිරට : එල්. එම්. විජේසිරිවර්ධන මුහන්දිරම් ට අයිති ගොඩැල්ලවත්ත යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු ඩී. බර්ටි ඒ ද සිල්වා විසින් සාදන ලද 1986.02.26 දිනැති අංක 2450 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-594/3

---

## සීමාසහිත සෙලාන් බැංකුව - අම්බලන්ගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-2512060-001

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.10 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද 1995 ඔක්තෝබර් 12 දිනැති අංක AMB/VEH/95002 සහ 1995 ඔක්තෝබර් 18 දිනැති අංක AMB/VEH/95003 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම බලපිටිය, "බලපිටිය ට්‍රේඩර්ස්" හි කොටස්කරුවන් වන මල්ලියා වඩු ලෝලිත ප්‍රසාද් ද සිල්වා සහ මල්ලියා වඩු ඇන්ඩෘ නිකලස් සීසර් ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකොලොස් ලක්ෂ දාහතරදහස් අටසිය දහඅටයි ශත නවයක (රු. 11,14,818.09) මුදලක් 2005 ජූලි 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 11,14,818.09 මුදල ද, 2005 අගෝස්තු 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක : AMB/VEH/95002 සහ AMB/VEH/95003 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති චංචල දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. වාහනය ලියාපදිංචි අංක : 42 ශ්‍රී 2331
   වාහනයේ වර්ගය : අළුත් ලංකා අශෝක් ලේලන්ඩ් ලොරිය
   එන්ජින් අංකය : ALEN 101462
   චැසි අංකය : LALG 00638

1995 ඔක්තෝබර් 12 දිනැති අංක : AMB/VEH/95002 දරන උකස් බැඳුම්කරය. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාකර්යාලයේ අංක : 05/207 හි ලියාපදිංචි කර ඇත.

2. වාහනය ලියාපදිංචි අංක : 47-8020
වාහනයේ වර්ගය : එයිචර් මිට්සුබිෂි ඩීසල් ලොරිය, අශ්ව බල 92.5
එන්ජින් අංකය : I-50627285
චැසි අංකය : 4EC 50734750

1995 ඔක්තෝබර් 18 දිනැති අංක AMB/VEH/95003 දරන උකස් බැඳුම්කරය. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වංවල 05/208 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

09-594/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව-වරකාපොල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0700-09754560-101

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 මැයි මස 13 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. එස් ද සේරම් විසින් සහතික කරන ලද 1998.08.05 දිනැති අංක 26 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වරකාපොල පදිංචි ජෝසප් මුහන්දිරම්ලාගේ බන්දුල ප්‍රේමසිරි සහ ගම්ලත් රාලලාගේ ශ්‍යාමා නිලන්ති යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දාහත්දහස් පන්සිය අනූඅටයි ශත දහනවයක් (රු. 3,17,598.19) මුදලක් 2004 නොවැම්බර් 30 වැනි දින වැනි විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 3,17,598.19 මුදල ද, 2004 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 26 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ එගොඩපොත පත්තුවේ, කිතලන්ගමුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. රූපශ්‍රී ආනන්ද විසින් සාදන ලද 1982 ජූනි 01 දිනැති අංක 425 දරන සැලැස්මේ සඳහන් දවල්හැබේ වත්ත සහ හේන නැමැති ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කල බෙදා වෙන් කල ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : පොල්කොටුව *හෙවත්* කදුරුගල පල්ල ද, නැගෙනහිරට : කැබලි අංක 5 ද, දකුණට : කැබලි අංක 3 සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම තුනයි පහක් (අ. 0, රූ. 01 පර්. 39.35) විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. පෙර ලියාපදිංචිය එස් 83/102.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

09-594/4

---

## මහජන බැංකුව - දංකොටුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.03.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2003.12.30 දිනැති අංක 1240 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සමරප්පෙරුම ආරච්චිගේ වෝල්ටර් සමරප්පෙරුම යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් අනූහයයි ශත හැත්තෑ එකක (රු. 8,33,096.71) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2005.02.07 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් අනූහයයි ශත හැත්තෑ එකක (රු. 8,33,096.71) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29එල්) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් අටලක්ෂ තිස්තුන්දහස් අනූහයයි ශත හැත්තෑ එකක (රු. 8,33,096.71) මුදල අයකර ගැනීම සඳහා හලාවත බලයලත් වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතා විසින් එකී අංක 1240 දරන උකස්කරය යටතේ, එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයට අයත් දකුණු පිටිගල් කෝරළයේ ඕතර පළාතේ, මැටිකොටුව නමැති ගමේ පිහිටි දිවුල්ගහවත්ත, කොස්ගහවත්ත, දැනට සියඹලාගහවත්ත, කහටගහවත්ත, හල්ගහවත්ත බෙදූ කොටස සහ කොහොඹගහවත්ත සහ කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ජී. ෂෙල්ටන් සමරතුංග මහතා විසින් 1986.10.10 වැනි දින මැන බෙදා වෙන් කරන ලද අංක 2618

දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතුරට : එකී ඉඩමෙන් පාරක් වශයෙන් වෙන් කර තිබෙන අඩි 10ක් පළල අංක 01 දරන බිම් තීරය ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් අංක 04 දරන කොටස සහ පී. බ්‍රම්පිසිංඤෝගේ ඉඩම ද, දකුණට : එකී පිඹුරේ අංක 02 දරන කොටස ද, බස්නාහිරට : එකී පිඹුරේ අංක 02 දරන කොටස ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් එකයි, පර්චස් දහ තුනයි දශම අටයි හතර (අ. 02, රූ. 0, පර්. 13.84) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේත් වේ.

ඉහත පිඹුරේ උතුරු මායිමේ ලොට් අංක 01න් පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි දෙකයි නවය (හෙ. 0.0329)ක් විශාල අඩි 10ක පළල පාරක් සඳහා වෙන් කළ බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් භාවිත කිරීමේ මාර්ග පරවශ්‍යතාවය ද සමඟ වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 71/108 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර-හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

09-650

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 158101.

2006ක් වූ ජූලි මස 14 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ඒ. කේ. ජයවර්ධන විසින් සහතික කරන ලද 2002 පෙබරවාරි මස 25 වැනි දින අංක 1332 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ අදාසූරිය මොහොට්ටලලාගේ නිමල් අදාසූරිය යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්එක්දාස් අටසිය පනස්හතයි ශත විසිහයක (රු. 2,31,857.26) මුදලක් 2006 ජූනි මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ තිස් එක්දහස් අටසියපනස් හතයි ශත විසිහයක (රු. 2,31,857.26) මුදල හා 2006 ජූනි මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,458.30 ක මුදලක් සඳහා වාර්ෂිකව 20% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1332 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය, මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණයඅයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ මහකෙළිය කැලිමුන සහ හබරගම ගම්වල පිහිටි මහකෙළිය එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 1997 ඔක්තෝබර් මස 2 වැනි දින අංක161/97 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන්කළ ලොට් 204 දරන ඉඩමට මායිම් එනම් උතුරට : ලොට් 205 (පාර) නැගෙනහිරට : ලොට් 89 (පාර), දකුණුට : ලොට් 203 හා බස්නාහිරට : ලොට් 206 න්ද යන මෙහි මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 161/97 පරිදි ප්‍රමාණය පර්චස් පහළොවක් (අක්. 0, රූඩ් 0, පර්. 15) විශාල ඉඩම හා එහි තුළ පිහිටි සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1200/119 හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

09-591/2

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1540008877.

ණය ගිණුම් අංකය : 232717.

2006 ක්වූ ජූලි මස 14 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සී. සමරසේකර විසින් සහතික කරන ලද 2005 මාර්තු මස 16 වැනි දින අංක 3054 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ නාලි ගමගේ ගාමිණී යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැට එක්දාස් අනූහයයි ශත විසිදෙකක (රු. 1,61,096.22) මුදලක් 2006 මැයි මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්ලක්ෂ හැට එක්දාස් අනූහයයි ශත විසිදෙකක (රු. 1,61,096.22) මුදල හා 2006 මැයි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,37,500 ක මුදලක් සඳහා වාර්ෂිකව 20% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 3054 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය, මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර

අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණයඅයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතල දිස්ත්‍රික්කයේ, කන්දපල්ල කෝරළේ (ගලේවෙල ප්‍රාදේශීය කොට්ඨාශය) තලකිරියාගම ගමේ පිහිටි කිරලගොල්ල ඉඩමේ ලොට් 01 ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූඩ් 01, පර්. 0) විශාල ඉඩමට බලයලත් මානක එල්. ඩී. මොල්ලිගොඩ විසින් මැන සාදන ලද 2004 ජූලි මස 29 වැනි දින අංක 4476 දරන පිඹුර ප්‍රකාරව එකි ලොට් 01 ට මායිම්, එනම් උතුරට : ලීනා උදයංගනී විසින් හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1046 ලොට් 01 න් ද, දකුණට : පාරෙන් ද, බස්නාහිරට : පිඹුරු අංක 1046 හි සඳහන් ලොට් 2 හි ඉතිරි කොටසින් ද හා එහිතුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ-ඩී 115/73 හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

09-591/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව-ස්ටාෆ් ඇඩ්වාන්ස් යුනිට්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0012-097777-000.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ජූලි මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. ලියනගේ විසින් සහතික කරන ලද 2001 අගෝස්තු මස 01 දිනැති අංක 106 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මොරටුව පදිංචි අල්බාර්තුලගේ සුභාෂ් චන්දන ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකොලොස් ලක්ෂ තිස්හතර දහස් තුන්සිය විසි හතරයි ශත අනූහයක් (රු. 11,34,324.96) මුදලක් 2005 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 11,34,324.96 ක මුදල ද, 2005 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 106 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාව තුළ කොරළවැල්ල පිහිටි බලයලත් මිනින්දෝරු ග්‍රේෂන් එස්. පෙරේරා විසින් සාදන ලද 1981 අගෝස්තු 25 දිනැති අංක 760 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් කොන්ස්ටන්ටයින් පටුමගේ වරිපනම් අංක 40/3 දරන වරිපනම් අංක 20/13සී සහ 20/13ඩී (කොටසක්) දරන මඩගහවත්ත සහ පයුරුගහවත්ත නමැති, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග (බලයලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1972.12.24 දිනැති අංක 6106 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ 2 කැබැල්ලෙහි නැවත මැනීමක් වන (බෙදා වෙන් කරන ලද ඒ 2 ඉඩම් කොටසට මායිම් උතුරට : ජේ. ඒ. පෙරේරා ගේ දේපල ද නැගෙනහිරට: මෙම ඉඩමේ කැබැලි අංක ඒ 3 ද, දකුණට : අඩි පාර (අඩි 4 ක් පළල) සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඒ 1 කැබැල්ල ද ය න මායිම් තුළ එකී අංක 760 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.65) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ හිමිකම් එම් 2555/5 හි ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොට්ගල.,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - නීති.

09-594/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/09/205/ජීජ්1/435.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.06.07 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩබ්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2004.10.25 දින හා අංක 18397 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම වැලිගම පදිංචි තුඩාව පත්තිනිගේ පියසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.05.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැටඅටදහස් හාරසීය තිස් නවයයි ශත දෙක (රු.68,439.02) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 18397 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසිදෙකයි ශත හැටනවය (රු. 22.69) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල හා 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර කොටුව, ශ්‍රී ධර්මාරාම

මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ කිරින්ද ග්‍රාමයේ පුහුල්වැල්ල සිට ආරන්‍ය පාර දක්වා දිවෙන ගම් සභා පාරේ පිහිටි මැදකොරටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් සකසන ලද අංක 1474 සහ 2001.03.07 දිනැති මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 26 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

09-633/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ගැණුනු යෝජනාව

ණය අංකය : 10/59074/ඩී10/301.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.22 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

1. තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. අන්ද්‍රාහැන්නදි විසින් සහතික කරන ලද 1996.07.16 දින හා අංක 1451 දරන උකස් බැදුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම නාකුළුගමුව පදිංචි මාකදුරගේ සමන්ත සංජීව යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.04.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් තුන්දහස් දෙසිය හැටයි ශත තිහ (රු.243,260.30) ක මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 1451 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් තිස් හතයි ශත අනූහය (රු.37.96) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදය දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගතයුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධිත සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 99, සේන හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම හි බලයලත් වෙන්දේසිකාර වී. සී. සේනානායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ ගලගම පිහිටි වැල්මීයන්හේන නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. බී. ජේ. පාලිත විසින් සකසන ලද 1996.02.16 දින සහ අංක 1154 දරන පිඹුරේ දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 24.87 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

09-633/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.